සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved]

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

දෙවන වාර ඇගයීම - 2025

**Second Term Evaluation - 2025**

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 11 | විෂයය Subject | ඉතිහාසය - I | කාලය Time | පැය 01 යි 01 hour |

නම : - ...................................................................................................... ශ්‍රේණිය :- ..................................................

## I පත්‍රය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි මූලාශ්‍රය කුමක් ද?
(1) මහා වංසය (2) ධාතු වංසය (3) දීප වංසය (4) නිකාය සංග්‍රහ

02. ලංකාවට පැමිණි ලංකාව පිළිබඳ තොරතුරු වාර්තා කළ පෘතුගීසි ජාතිකයා වන්නේ,
(1) හියුංසියැන් හිමි (2) පිලිප්පස් බැල්දියස් (3) රොබට් නොක්ස් (4) රිබෙයිරෝ

03. මෙරට දේශපාලන ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍රය වන්නේ,
(1) නිකාය සංග්‍රහය (2) රාජාවලිය (3) පූජාවලිය (4) දීපවංසය

04. තමා ජීවත් වූ ලෙන සුදුසු පරිදි සකස් කර ගැනීමට ගත් උත්සාහයකට අදාළව ගැල්බැම්මක කොටසක් හමුවන ස්ථානය වන්නේ,
(1) කුරුවිට බටදොඹලෙන (2) අත්තනගොඩ අලුලෙන
(3) කිතුල්ගල බෙලිලෙන (4) බුලත්සිංහල පාහියන්ගල ලෙන

05. ප්‍රාග් ඓතිහාසික මානවයා මියගිය තම ඥාතීන් ජීවත් වූ ගල්ලෙන තුළ වැළලීමේ චාරිත්‍රයක් පැවතුණි. එසේ වළලන ලද මිනිස් ඇටසැකිලි නවයක් හමු වූ ස්ථානය වූයේ,
(1) අළුලෙන (2) පාහියන්ගල
(3) බෙල්ලන් බැදි පැලැස්ස (4) බෙලිලෙන

06. පරිපාලන දිස්ත්‍රික්ක ආස්ථාන වශයෙන් වෙන් කොට ඒවා පාලනය කිරීම සිදුකළ බවට තොරතුරු අනාවරණය වන මුලාශ්‍රය වන්නේ,
(1) වල්ලිපුරම් රන්සන්නස (2) පනාකඩුව තඹ සන්නස
(3) රසවාහිනිය (4) වංසත්ථප්පකාසිනි

07. ක්‍රි.පූ. 450 පමණ කාලයේ මෙරට නාගරික ලක්ෂණ පෙන්වමින් වර්ධනය වූ නගර දෙකක් වූයේ,
(1) සිගිරිය හා මහනුවර (2) රංචාමඩම හා බෙරගල
(3) අනුරාධපුරය හා මාගම (4) අනුරාධපුර හා පොළොන්නරුව

08. මෙරට දේශපාලන බලය මධ්‍යගත කරගත් ආරම්භක පාලකයා වන්නේ,
(1) නිශ්ශංකමල්ල රජු (2) පණ්ඩුකාභය රජු
(3) දුටුගැමුණු රජු (4) වසභ රජු

09. ව්‍යවස්ථාදායකය හා විධායකය හැඳින්වීමට ''එක්තැන්සමීය'' යන වචනය භාවිත කළ බවට තොරතුරු සඳහන් සෙල්ලිපිය වන්නේ,
(1) වේවැල්කැටිය (2) කොරවක්ගල (3) කලුදිය පොකුණ (4) බුද්ධන්නෙහෙල

10. රාජතාන්ත්‍රික සබඳතා වර්ධනය කර ගැනීමේ අරමුණින් දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට සහභාගී වූ රජු ලෙස සඳහන් වන්නේ,
(1) පළමු වන ගජබාහු රජු
(2) පළමුවන විජයබාහු රජු
(3) භාතිකාභය රජු
(4) හයවන අග්‍රබෝධි රජු

11. පහත A තීරුවෙන් රජවරුද B තීරුවෙන් එම රජවරුන් විසින් පනවන ලද නීතීන් ද දක්වේ. A හා B නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | | B |
|---|---|---|
| (1) අමණ්ඩගාමිණී අභය රජු | A - | වල්වල දඩුපත් නොකපනු ඉසා |
| (2) හතරවන මිහිඳු රජු | B - | මාඝාත නීතිය |
| (3) තුන්වන උදය රජු | C - | ගෘහදණ්ඩ බද්ද |
| (4) නිශ්ශංකමල්ල රජු | D - | ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු ය. |

(1) D A C B (2) B C A D (3) C B A D (4) D C B A

12. පහත A තීරුවේ මෙරට විවිධ කර්මාන්තවල නිරත ශිල්පීන් ද B තීරුවේ කර්මාන්තද දක්වෙන අතර A හා B තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | | B |
|---|---|---|
| (1) කබර | A - | නූල් කැටීම |
| (2) දටික | B - | චිත්‍ර ඇඳීම |
| (3) කතවය | C - | යකඩ වැඩ |
| (4) චිතකර | D - | ඇත් දත් |

(1) C D B A (2) B C A D (3) B C D A (4) C D A B

13. මෙරට රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා දකුණු ඉන්දීය කුලී හේවායන්ගේ සහාය නොපැතූ රජෙකු ලෙස සැලකෙන්නේ,
(1) අභයනාග රජු
(2) ඉලනාග රජු
(3) පළවෙනි විජයබාහු රජු
(4) මුගලන් රජු

14. පැරණි කාලයේ කෙටි දුර මැනීම සඳහා භාවිතා කළ අගල් 9 ක දුරක් හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) ගව්ව (2) වියත (3) යොදුන (4) උසබ

15. සාලිය කුමරුගේ බිසව වූ අශෝකමාලා රසවත්ව ආහාර පිළියෙළ කර දී දුටුගැමුණු රජමාලිගාවේ කාගේත් හිත් දිනාගත් බව සඳහන් වන මූලාශ්‍රය වන්නේ,
(1) ධම්පියා අටුවා ගැටපදය
(2) සද්ධර්මාලංකාරය
(3) රසවාහිනීය
(4) සහස්සවත්ථුපකරණය

16. මෙරට වාස්තු විද්‍යාත්මක නිර්මාණයන් වල අග්නිදිග ආසියාතික ලක්ෂණ හඳුනාගත හැකි නිර්මාණයක් වන්නේ මින් කුමක් ද?
(1) සීගිරිය
(2) පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය
(3) ඉසුරුමුණි විහාරය
(4) දඹදෙණියේ විජේසුන්දරාමය

17. මෙරට මුලින්ම කාසි භාවිතය ආරම්භ වූ රාජ්‍ය සමය වන්නේ,
(1) දේවානම්පියතිස්ස රජු දවස ය.
(2) පණ්ඩුකාභය රජු දවස ය.
(3) දුටුගැමුණු රජු දවස ය.
(4) මහා විජයබාහු රජු දවස ය.

18. පහත ''A'' තීරුවේ රාජධානි ද ''B'' තීරුවේ එම රාජධානිවල සිටි ආරම්භක රජවරුන්ද දක්වේ. ''A'' හා ''B'' තීරු ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | | B |
|---|---|---|
| (1) යාපහුව | A - | හතරවන බුවනෙකබාහු |
| (2) දඹදෙණිය | B - | හයවන පරාක්‍රමබහු |
| (3) ගම්පොළ | C - | තුන්වෙනි විජයබාහු |
| (4) කෝට්ටේ | D - | පළවෙනි බුවනෙකබාහු |

(1) D C B A (2) D B C A (3) D C A B (4) D A B C

19. ඇම්බැක්කේ දේවාලය ඉදිකරන ලද රජු වන්නේ,
(1) දෙවන බුවනෙකබාහු (2) තුන්වන වික්‍රමබාහු
(3) හතරවන බුවනෙකබාහු (4) හයවන පරාක්‍රමබාහු

20. සීතාවක පාලකයා වූ පළමුවෙනි රාජසිංහ රජුට උඩරට ආක්‍රමණය සඳහා සහය දුන් ප්‍රභූවරයා වූයේ,
(1) ජයවීර බණ්ඩාර ය. (2) වීරසුන්දර බණ්ඩාර ය.
(3) යමසිංහ බණ්ඩාර ය. (4) කොනප්පු බණ්ඩාර ය.

21. පිළිමතලාව්වේ අදිකාරම්ගේ අවශ්‍යතාව මත රජකමට පත් කන්නසාමි කුමරු රජ වූයේ කුමන නමකින් ද?
(1) කීර්ති ශ්‍රී රාජසිංහ (2) ශ්‍රී විජය රාජසිංහ
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ (4) රාජාධිරාජසිංහ

22. පහත සංදේශ කාව්‍ය අතරින් ගම්පොළ රාජධානියේ රචනා වූ සංදේශ කාව්‍ය පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) තිසර සංදේශය, පරෙවි සංදේශය
(2) මයූර සංදේශය , සැළලිහිණි සංදේශය
(3) මයූර සංදේශය, පරෙවි සංදේශය
(4) මයූර සංදේශය, තිසර සංදේශය

23. වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමූ උඩරට රාජධානියේ රජතුමා වූයේ,
(1) කීර්ති ශ්‍රී රාජසිංහ (2) ශ්‍රී විජය රාජසිංහ
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ (4) රාජාධිරාජසිංහ

24. 1505 පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට යාපන රාජධානියේ පාලකයා වූයේ,
(1) සංකිලි කුමාර (2) පරරාජසේකරම්
(3) විජය කුලංකෙයි (4) එදිරිමාංනසිංහම්

25. බලන සටනට නායකත්වය දුන් උඩරට රජු හා පෘතුගීසි සෙන්පතියා නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) පළමුවන රාජසිංහ රජු - අපෝන්සු ද ලසර්දා
(2) පළමුවන විමලධර්මසූරිය රජු - දොන් ජෙරනිමෝ ද අසවේදු
(3) දෙවන රාජසිංහ රජු - පේරෝලෝපෙස් ද සූසා
(4) දෙවන රාජසිංහ රජු - කොන්ස්තන්තිනූ ද සා

26. 1602 දී ලංකාවට පැමිණි ලන්දේසි දූතයෙකු වූ ජොරිස්වැන් ස්පිල්බර්ජන් සමඟ සාකච්ඡා පැවැත් වූ උඩරට පාලකයා වූයේ,
(1) රාජාධිරාජසිංහ රජු (2) පළමුවෙනි විමලධර්මසූරිය රජු
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (4) ශ්‍රී වික්‍රමරාජසිංහ රජු

27. අත්හදා බැලීමේ පියා ලෙස හැඳින්වූයේ,
(1) නිකලස් කොපර්නිකස් (2) ජොහැන්නස් කෙප්ලර්
(3) ගැලිලියෝ ගැලිලි (4) අයිසෙක් නිව්ටන්

28. පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ ජර්මන් ජාතිකයා වූයේ,
(1) ඉරාස්මස් (2) මාටින් ලූතර් (3) ජෝන් හස් (4) ජෝන් වයික්ලිප්

29. 18 වන සියවසේ අග භාගයේ යුරෝපයේ සිදු වූ වැදගත් සිදුවීමක් වූයේ,
(1) ඉංග්‍රිසි විප්ලවය (2) පුනරුදය
(3) කාර්මික විප්ලවය (4) ප්‍රංශ විප්ලවය

30. කොළඹ මහනුවර මහාමාර්ගය ඉදිකරන ලද ආණ්ඩුකාරවරයා වූයේ,
(1) එඩ්වඩ් බාන්ස් (2) හෙන්රි වෝඩ් (3) තෝමස් මෙට්ලන්ඩ් (4) ෆෙඩ්රික් නෝර්ත්

31. ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි දූත කණ්ඩායමේ නායකයා හා එම අවධියේ උඩරට පාලකයා නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) හියු බොයිඩ් - රාජාධිරාජසිංහ රජු
(2) ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(3) රොබට් ඇන්ඩෘස් - රාජාධිරාජසිංහ රජු
(4) මැක්ඩෝවල් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

32. බෞද්ධ ආගමික පුනර්ජීවනයක් ඇති කිරීමේ අරමුණින් රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන ආරම්භ කිරීමට මුල් වූයේ,
(1) රත්මලාවේ ධම්මාලෝක හිමි (2) වලානේ සිද්ධාර්ථ හිමි
(3) හික්කඩුවේ සුමංගල හිමි (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

33. පහත A තීරුවේ ඉංග්‍රීසින් විසින් ලංකාව තුළ බල ව්‍යාප්තියට අදාළ සිදුවීම කිහිපයක් ද B තීරුවේ එම සිදුවීම් සිදු වූ වර්ෂයන් ද සඳහන් වේ. A, B තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | | B |
|---|---|---|
| (1) ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවීම | A - | ක්‍රි.ව. 1798 |
| (2) ප්‍රථම ඉංග්‍රීසි විරෝධී සටන | B - | ක්‍රි.ව. 1796 |
| (3) ඉංග්‍රීසි ප්‍රථම උඩරට ආක්‍රමණය | C - | ක්‍රි.ව. 1818 |
| (4) ද්විත්ව පාලනය ආරම්භ වීම. | D - | ක්‍රි.ව. 1803 |

(1) B A C D (2) B D C A (3) A C B D (4) B C D A

34. අනුරාධපුරයේ පූජනීය වස්තු රැකගැනීමේ ව්‍යාපාරයක් දියත්කළ ලාංකිකයා වන්නේ,
(1) පොන්නම්බලම රාමනාදන් මහතා (2) ටී.බී. ජයා මහතා
(3) අනගාරික ධර්මපාලතුමා (4) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා

35. මෙරට පැරණිතම දේශපාලන පක්ෂය වන්නේ,
(1) ලංකා කොමියුනිස්ට් පක්ෂය (2) ලංකා සමසමාජ පක්ෂය
(3) එක්සත් ජාතික පක්ෂය (4) ෆෙඩරල් පක්ෂය

36. 1953 හර්තාල් ව්‍යාපාරය නිසා අගමැති ධූරයෙන් ඉල්ලා අස් වූ අගමැතිවරයා හා පුරප්පාඩු වූ අගමැති තනතුරට තේරී පත් වූ පුද්ගලයා නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) ඩී.එස්. සේනානායක මහතා - ජෝන් කොතලාවල මහතා
(2) ජෝන් කොතලාවල මහතා - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
(3) ඩඩ්ලි සේනානායක මහතා - ජෝන් කොතලාවල මහතා
(4) ජෝන් කොතලාවල මහතා - ඩඩ්ලි සේනානායක මහතා

37. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අනුව ජනතාව නීති සම්පාදන ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වන අවස්ථාව වන්නේ,
(1) ජනාධිපතිවරණය (2) ජනමත විචාරණය
(3) සමානුපාතික නියෝජනය (4) මහමැතිවරණය

38. නිදහස ලැබීමට පෙර ආරම්භ කරන ලද ගොවි ජනපද ව්‍යාපාරයක් වන්නේ,
(1) පරාක්‍රම සමුද්‍රය (2) ගිරිතලේ (3) කන්තලේ (4) ගල්ඔය

39. කොත්මලේ ජලාශය ඉදිකිරීම සඳහා අනුග්‍රහය ලබා දුන් යුරෝපා රට කුමක් ද?
(1) ප්‍රංශය (2) ස්විඩනය (3) බ්‍රිතාන්‍ය (4) බටහිර ජර්මනිය

40. මෙරට නිර්මාණය වූ ප්‍රථම කාර්මික ජනපදය වූයේ,
(1) රත්මලාන (2) කොග්ගල (3) කටුනායක (4) ඒකල